පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 95

සෞඛ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

	පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 95 ආයතනයේ නම - සෞඛ්‍ය අමාත්‍යාංශය	
	කාරක සභා නිරීක්ෂණය/නියෝගය/නිර්දේශය	නිර්දේශය/නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
01	- සෞඛ්‍ය අමාත්‍යාංශය සතු අස්ථානගත වී ඇති වාහන 1794 පිළිබඳ ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඒ පිළිබඳ ලිඛිත වාර්තාවක් 2023.07.23 ට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම. - සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය සඳහා ලබාගෙන තිබුණු මෘදුකාංගය විධිමත් අයුරින් ක්‍රියාත්මක නොවන බව.	- පළාත් සෞඛ්‍ය ආයතන මඟින් වෙන්දේසි කරන ලද වාහන විස්තර ලබා ගැනීමට ලිපි යොමු කිරීම - භෞතික පරීක්ෂණයක් මඟින් පළාත් සෞඛ්‍ය ආයතන සතු වාහන පරීක්ෂාවට ලක් කිරීම - පවරා දී ඇති වාහන සඳහා නිකුත් කිරීමේ නියෝග ලබා දී ලැබීම් නියෝග ලබා ගැනීමට කටයුතු කිරීම - වෙන්දේසි කර ඇති මේ වන විටත් පවරාගෙන නොමැති වාහන වහාම පවරා ගන්නා ලෙස අදාළ පුද්ගලයින්ව ලිඛිතව දැණුවත් කිරීම - හඳුනා නොගත් වාහන 679 න් වාහන 240 ක් හඳුනාගෙන ඇති අතර මෝටර් බයිසිකල් 1115න් 444ක් හඳුනාගෙන ඇත. - හඳුනා නොගත් වාහන සඳහා වාර්ෂික අදායම් බලපත්‍ර නිකුත් කිරීම තවදුරටත් අත්හිටුවා ඇත. - රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල විෂය නිලධාරීන් සඳහා වැඩමුළුවක් පවත්වා දැණුවත් කිරීමේ කටයුතු සිදුකර වාහන කළමනාකරණය සඳහා වූ මෘදුකාංග පද්ධතිය ක්‍රියාවට නැංවීමේ කටයුතු සිදුකර ඇත.
02	මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු විසින් පෙන්වා දුන් කරුණු, • <u>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව</u> - සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගිණුම් වලට අදාළව මූල්‍ය නොවන වත්කම් වල විශාල වෙනසක් පැවතීම - ගිණුම් තුලනය කිරීමේ ගැටළු	2018 වසරේ සිට 2024 දක්වා ප්‍රාග්ධනගත නොවූ වටිනාකම් හඳුනාගෙන ප්‍රාග්ධනගත කිරීමේ ආරම්භක පියවර ගෙන ඇත. ඒ අනුව 2023 වර්ෂයේ ප්‍රාග්ධනගත නොවූ රු. මිලියන 11,605.50ක් වූ වටිනාකමින් රු, මිලියන 9,411.18කට අදාළ වත්කම් ප්‍රාග්ධනගත කරවන ලදී. 2018 වර්ෂය වනවිට ආරම්භක ශේෂයට එකතුකිරීම් (Opening Balance Addition) තීරයක් එකතුකර නොතිබීම හේතුවෙන් මෙම රු. මිලියන 7,102.99ක වත්කම් 2019 වර්ෂයේ අලුතින් ඉඩම් අත්පත්කර ගැනීමක් ලෙස දැක්වීමට සිදුවී ඇත. එමෙන්ම, 2019 සිට 2022 වර්ෂයන් අතර ප්‍රාග්ධනගත වියයුතු රු. මිලියන 10,531.14ක වටිනාකමක්, 2024 වර්ෂයේ ප්‍රාග්ධනගතවිය යුතු රු. මිලියන 122.85ක වටිනාකමක් සහ 2013 සිට 2018 වර්ෂයන් අතර ප්‍රාග්ධනගත වියයුතු රු. මිලියන 3,926.43ක වටිනාකමක් හඳුනාගෙන ප්‍රාග්ධනගත කරවීමට කටයුතු කර ඇත. එසේම, 2024 වර්ෂයේ සිට මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡාකර සලසාගත් පාලන ක්‍රමවේදයක් ඔස්සේ සිගාස් වැඩසටහන තුළ ඇතුළත්වන වත්කම් ප්‍රාග්ධනිත ගත කිරීම් මාසිකව තුලනය කරනුලැබේ. ඉදිරියට ද වත්කම් ප්‍රාග්ධනිත කිරීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

	- අත්තිකාරම් බී ගිණුමේ තිබූ අයකර නොගත් ණය මුදල්	• ණය ලබාගත් වර්තමානයේ සේවයේ නියුතු සියලු නිලධාරීන්ගේ නම, තනතුර, ලිපිනය, හැඳුනුම්පත් අංකය, වැටුප් අංකය, ඇපකරුවන්ගේ සියලු තොරතුරු ඇතුලු අනන්‍යතාවය හා ණය ශේෂයන්ගේ විස්තර තහවුරු කර ගත හැකි සියලු තොරතුරු ගොනුවක් ගිණුම් අංශය තුල පවත්වාගත යුතු බවට උපදෙස් ලබා දී ඇත. එමඟින් ඉදිරියේදී ඇති වන තොරතුරු හිඟකම අවම මට්ටමකට ළඟා වේ. • ණය ලබාගත් නිලධාරීන්ගේ කේවල ණය ශේෂයන් **Payroll** හි විස්තර සමඟ සෑම මසකම තුලනය කළ යුතු බවත් ගිණුම් පොත් තුල ලැබීම් ගෙවීම් සියල්ල සෑම මසක් පාසාම යාවත්කාලීන කළ යුතු බවත් උපදෙස් ලබා දී ඇත. • අභ්‍යන්තර ස්ථාන මාරු ගිය සහ පැමිණි නිලධාරීන්ගේ 2020 වර්ෂයෙන් පසු සියලු තොරතුරු වර්ෂය තුළදීම ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමෙන් අනතුරුව තුලනය කරන බැවින් මේ වන විට ගිණුම තුල පවතින්නේ පැරණි ණය ශේෂයන් වන අතර එම ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා ද අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. • පළාත් සභා ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා රෝහල් සහ ආයතනවලින් තොරතුරු ගෙන්වා ගැනීමෙන් අනතුරුව අදාළ පළාත් වෙත දැනුම් දී එම ආයතනවලින්ද තොරතුරු කැඳවා ණය ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර ඇත. • මියගිය, වැඩතහනම් වූ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව ලබා දී ඇත. • මියගිය, වැඩතහනම් වූ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ තවදුරටත් අයනොවන, අයකරගැනීමට සියලු උත්සාහයන් දැරූ නමුත් අයකර ගත නොහැකි ණය ශේෂයන් පොතෙන් කපාහැරීම සඳහා ආකෘතින් පත්‍ර හඳුන්වා දී තොරතුරු රැස්කර රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. • විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ලිපිගොනු කඩිනමින් සකස්කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන ණය ශේෂයන් නිරවුල් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. • අත්තිකාරම් බී ගිණුමට අදාළව පවතින දීර්ඝ කාලීන ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් සජීවීව සහ **Zoom** තාක්ෂණය ඔස්සේ සාකච්ඡා පවත්වා උපදෙස් ලබා දී ඇත. • අත්තිකාරම් 'බී' ගිණුමට අදාළව පවතින දීර්ඝ කාලීන ණය ශේෂ අය කර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචනය කිරීමට කටයුතු කර ඇත. • විගණන විමසුම් හරහා නිරීක්ෂිත කරුණු නිවැරදි කරවීමට කටයුතු කරවීම හා ඇතැම් කරුණු විගණනයන්හිදී පරීක්ෂා කරන මෙන් අභ්‍යන්තර විගණක දැනුවත් කිරීම. • ණය අය කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි සැළැස්මට අදාළව තොරතුරු ගෙන්වා ගැනීම සහ එහි ඉදිරිපත් කර ඇති ආකාරයට ණය අය කර ගැනීම සිදු වන්නේද යන්න පසු විපරම් කිරීම. • අත්තිකාරම් 'බී' ගිණුම සය මාසිකව තුලනය කිරීම.

	- නොපියවූ අත්තිකාරම් මුදල් සහ මු.රෙ.106 යටතේ දුන් මුදල් අත්තිකාරම්	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අනෙකුත් අත්තිකාරම් (7000-0-0-111-0-002) යටතේ වෛද්‍ය සැපයුම් අංශයට වර්ෂ ගණනාවකට පෙර ලබාදුන් රු. 1,222,599,026 ක නොපියවූ අත්තිකාරම් නිරවුල් කිරීමට අවශ්‍ය නිර්දේශ ලබාදෙන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවට අනුව 2024 වර්ෂය තුල නාමික ප්‍රතිපාදනයක් ලබාගෙන මෙම අක්‍රීය අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීම සුදුසු බව නිර්දේශ කර ඇත. වෛද්‍ය සැපයිම් අංශයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත 2018 සිට 2023 වර්ෂය දක්වා පැවති පියවීම් නොකළ හර නිවේදන පත් සඳහා රුපියල් බිලියන 23.8 ක මුදලක් පියවීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. 2008 -2017 වර්ෂය දක්වා පවතින හිඟ මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය ඉදිරි වැඩකටයුතු ද මේ වන විට සිදු කරමින් පවතී.
	• <u>රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව</u> - 2022 ජූලි මස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නිකුත් කර ඇති හදිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරන්නේ නම් ප්‍රසම්පාදන ගැටලු විසඳා ගත හැකි බව	සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදෙමින් නිකුත් කර ඇති අංක PFD/PMD/Health/HSEPP/01/2022 හා 2022.06.06 දිනැති චක්‍ර ලේඛය හා අංක 22/0714/512/004 හා 2022.06.01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට 2022.06.06 දින ලබාදුන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ස්ථාපනය කරනු ලැබූ සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව මඟින් හදිසි ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක කර ඇත. සෞඛ්‍ය අංශ මෙම හදිසි ප්‍රසම්පාදන කමිටුව 2022.12.31 දින දක්වා ක්‍රියාත්මක වූ අතර, අංක අමප/23/0226/610/014 හා 2023.02.13 සහ අමප/23/1168/610/014-1 හා 2023.07.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් 2023 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුවේ කාලය දීර්ඝ කර ඇත. ඒ අනුව මෙම හදිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව 2022 වර්ෂයේ ජූලි මස සිට 2023 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා හදිසි ප්‍රසම්පාදනයන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කොට ඇත. කෙසේ වුවද 2023 දෙසැම්බර් මාසයෙන් පසුව සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව ක්‍රියාකාරී නොවන අතර, එම හදිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශය යටතේ තවදුරටත් ප්‍රසම්පාදනයන් සිදු නොකරයි.
	• <u>ජාතික අයවැය දෙපාර්තමේන්තුව</u> - වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් 1/3 ක් පමණ වෛද්‍ය සැපයීම් සඳහා වෙන් වන බවත්	ඩොලරයට සාපේක්ෂව අයිතමවල මිල ඉහළයාමත්, ආර්ථික දුෂ්කරතා හේතුවෙන් වෙළඳපොළෙන් ඖෂධ මිලදී ගැනීමේ හැකියාව අවමවීම මත රජයේ රෝහල් සඳහා විශාල රෝගීන් ප්‍රමාණයක් සායන සඳහා සහ විවිධ ප්‍රතිකාර සඳහා රෝහල් ගතවීම හේතුවෙන් වෛද්‍ය සැපයිම් වල පරිභෝජනය වැඩි වී ඇත.

	- නිවැරදි පුරෝකථනයන් ලබා දීමට කටයුතු කරන්නේ නම් ප්‍රතිපාදන නිසි පරිදි වෙන්කල හැකි බවත් - ආරක්ෂිත තොග නිසි ලෙස පවත්වාගෙන නොයෑම සහ හදිසි මිලදී ගැනීම් වැඩි වශයෙන් සිදු කිරීම වැනි දුර්වලතා වළක්වා ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය බව	එමෙන්ම බෝනොවන රෝග වන දියවැඩියාව, අධි රුධිර පීඩනය, වකුගඩු රෝග සහ පිළිකා වැනි රෝග හේතුවෙන් දෛනිකව වාර්තාවන රෝගීන් ප්‍රමාණය ඉහල යාම නිසා වාර්ෂිකව අවශ්‍යවන වෛද්‍ය සැපයීම් ප්‍රමාණය සීග්‍රයෙන් ඉහළයාම නිසා වාර්ෂික අයවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වෛද්‍ය සැපයීම් සඳහා අවශ්‍ය වේ. එබැවින් පෙර වර්ෂවලට සාපේක්ෂව වාර්ෂික ඇස්තමේන්තුව සඳහා වෙන්කළ යුතු ප්‍රමාණය ඉහළ අගයක් ලෙස වාර්තා වේ. එම නිසා වාර්ෂිකව වැයවන ප්‍රමාණය අවම කර ගැනීම සඳහා දීර්ඝ කාලීන වැඩපිළිවෙලක අවශ්‍යතාවය පවතින අතර ඒ සඳහා බෝවන රෝග පාලනය, නිරෝගී දරු පරපුරක් බිහි කිරීම, නිවැරදි ආහාර රටාව හා ජීවන රටාව සඳහා ප්‍රජාව යොමු කිරීම, සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සැකසීම, නිරෝගී දිවි පැවැත්මක් සඳහා ශාරීරික ව්‍යායාම ඇතුළත් වන විවිධ ප්‍රචාරක වැඩසටහන් වෙත ප්‍රජාව යොමු කිරීම කාලීන අවශ්‍යතාවයක් වන බැවින් බෝ නොවන රෝග පාලනය සඳහා එය අත්‍යවශ්‍ය කටයුත්තක් වී ඇත. එබැවින් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ද මේ සඳහා විවිධ ආකාරයෙන් මැදිහත්වීම් සිදු කරන අතර වසංගත රෝග විද්‍යා අංශය මඟින් පවත්වා ගෙන යනු ලබන ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීමේ වැඩ සටහන් හා පවුල් සෞඛ්‍ය කාර්යාංශය මඟින් ලබා දෙනු ලබන මාතෘ සායන හරහා ලබා දෙන පෝෂණ මට්ටම් ඉහළ නැංවීමේ වැඩ සටහන් මඟින් සෞඛ්‍ය සම්පන්න නිරෝගී දරුවන් බිහි කිරීමට අවශ්‍ය මහ පෙන්වීම සිදු කරයි. තවද ක්ෂය රෝග, ලිංගාශ්‍රිත රෝග, මැලේරියා, බරවා හා ලාදුරු වැනි ඉහත සඳහන් කළ ජාතික වශයෙන් වැදගත් වන ව්‍යාපෘති සඳහා මීට පෙර ලබා දුන් ලෝක සෞඛ්‍ය සංවිධානය හා අනෙකුත් සංවිධාන මඟින් ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදන සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීම මත මේ වන විට ඇතැම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන ඖෂධ ලබා ගැනීම සඳහා මුදල් වැය කිරීමට සිදු වී ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මඟින් දේශීය නිෂ්පාදකයින්ගෙන් ද, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් ආනයනික වෛද්‍ය සැපයුම්කරුවන්ගෙන් ද ප්‍රසම්පාදනය කර රජයේ රෝහල් හා සෞඛ්‍ය ආයතන සඳහා අවශ්‍ය වෛද්‍ය සැපයීම් ලබා ගැනීම මූලික ලෙස සිදු කරයි. එබැවින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන වෛද්‍ය සැපයීම් සඳහා පුරෝකථනය නියමිත වර්ෂයට පෙර වර්ෂයේ අගෝස්තු / සැප්තැම්බර් මාසයේ දී සිදුකර ඇණවුම් සැපයුම්කරුවන්ට ලබාදීම සිදු කරනු ලබයි. ඒ අනුව මෙම ඉදිරි වසර සඳහා දේශීයව නිෂ්පාදකයින් හෝ මිලදී ගැනීම සඳහා ඒ වනවිට මිල කැඳවීම් සිදුකර ඇත. ඒ අනුව අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඇණවුම් ලබා දීමට නියමිතව ඇත.

		තවද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ආනයනික වෛද්‍ය සැපයීම් ලබා ගැනීමට වසරකට ආසන්න පොරොත්තු කාලයක් (Lead time) සහිතව ලබා දීම සඳහා 2025 වර්ෂයේදී පියවර ගෙන ඇති අතර ඒ අනුව 2026 වර්ෂය සඳහා 2025/01/31 දිනට පෙර ඇණවුම් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දීමට කටයුතු කර ඇත. තවද මේ වන විට 2026 වසර සඳහා වෛද්‍ය සැපයීම් අවශ්‍යතාවය ලබා ගැනීමට ඇස්තමේන්තු ක්‍රියාවලිය මේ වන විට වෛද්‍ය සැපයීම් අංශය මඟින් ආරම්භ කර ඇති බැවින් ආනයනික ඖෂධ සඳහා 2027 වර්ෂය තුළ ආනයනය කළ යුතු වෛද්‍ය සැපයීම් 2026 වසර සඳහා ආයතන මඟින් ලැබෙන ඇස්තමේන්තුව ද පාදක කරගනිමින් 2026/2027 වසර සඳහා පුරෝකථනයන් සිදු කර ඇණවුම් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එබැවින් ඉදිරි වසර සඳහා නිවැරදි පුරෝකථනයක් ලබා දීමට එය පහසුවක් වනු ඇත. සැපයීම් ක්‍රියාවලිය අඛණ්ඩව පැවතීම, නියමිත වෙලාවට මූල්‍ය ප්‍රතිපාදන ලැබීම සහ ප්‍රමාණවත් ගබඩා පහසුකම් පැවතීම, ආරක්ෂිත තොග පවත්වාගෙන යාම සඳහා මූලික වශයෙන් බලපානු ලබයි. ඒ අනුව මේ වන විට ආනයනික ඖෂධ සඳහා අවම මාස 06 ක තොගයක් එක් එක් අයිතමය සඳහා ලබා ගැනීමට ඇණවුම් කාල සටහන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දී ඇති අතර ඒ අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ණයවර ලිපි නිකුත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. තවද මේ වන විට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර 2026 ඇණවුම්වල තොග මේ වසරේ නොවැම්බර් මස සිට ලබා ගැනීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. මීට අමතරව වෛද්‍ය සැපයීම් අංශයේ පවතින ගබඩා පහසුකම් පුළුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. ඒ අනුව ආසියානු සංවර්ධන බැංකුව (ADB) හා ලෝක බැංකු (WB) ආධාර මත නව ගබඩා ඉදිකිරීම සහ පුළුල් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්ව ඇති අතර එම කටයුතු හැකි ඉක්මණින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව වෛද්‍ය සැපයීම්වල ගුණාත්මක භාවය ද ආරක්ෂාවන පරිදි ස්වාරක්ෂිත තොග නිසි ලෙස පවත්වාගෙන යෑමට වැඩ පිළිවෙලක් සකස් කර ඇත. මීට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා දේශීය නිෂ්පාදකයින් හරහා නව ඖෂධ නිපදවීමට දිරිගන්වා ඇති අතර එම ඖෂධවල තොග එම නිෂ්පාදකයින්ගේ ගබඩාවල පවත්වාගෙන යාමට ඉල්ලීම් සිදුකර ඇති අතර ඒ හරහා ද සැලකිය යුතු තොග ප්‍රමාණයන් පවත්වාගෙන යාමෙන් අඛණ්ඩව ඖෂධ සැපයීමක් සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට අපේක්ෂා කර ඇත.

		ඒ අනුව හදිසි මිලදී ගැනීම් සිදු කිරීම මේ වන විට අවම කර ඇති අතර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා සිදු කරන සාමාන්‍ය ප්‍රසම්පදනයට මේ වන විට ප්‍රමුඛත්වය ලබා දී එය දිරිගන්වා ඇත. කෙසේ වුවද ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැතිවීම හෝ වෙනත් ප්‍රසම්පාදන ගැටළු හේතුවෙන් සැපයීමට නොහැකි ඖෂධ ලබා ගැනීම සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග හරහා එම ඖෂධ ලබා ගැනීමට අවශ්‍ය මූලික පියවර මේ වන විට සකසා ඇති අතර එය ඖෂධ හිඟය අවම කර ගැනීම සඳහා සාර්ථක වනු ඇතැයි අපේක්ෂා කරමි.
03	කොළඹ ජාතික රෝහලේ ශල්‍ය පරිභෝජ්‍ය ද්‍රව්‍ය සහවා තැබීමේ සිදුවීම	අංක MH/FS/PI/AS I/2023/A-313/275 යටතේ මූලික විමර්ශන කටයුතු අවසන් කර ඉදිරි විනය කටයුතු සිදු කිරීම සඳහා යොමු කෙරිණ. ඒ අනුව, **ගොණු අංක CF/DPJ/2022/30 - හෙද නිලධාරිනී W.K.I.කුමාරසිරි මහත්මියට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.** 2022.10.17 දිනැතිව මෙම නිලධාරිනියගේ රාජකාරී වැඩ තහනම් කර ඇත. 2023.09.21 දිනැතිව චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර ඒ සඳහා නිලධාරිනිය විසින් 2023.12.01 දිනැතිව පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව විධිමත් විනය පරීක්ෂණය සඳහා 2024.01.15 දිනැතිව පරීක්ෂණ මණ්ඩල පත්කර ඇත. පරීක්ෂණ නිලධාරියා වෙනස් කරන ලෙස චුදිත නිලධාරිනිය විසින් අවස්ථා කිහිපයකදීම ඉල්ලීම් කරඇති අතර එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ බැවින් එම නිලධාරිනිය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ද අභියාචනයක් යොමුකර ඇත. පරීක්ෂණ නිලධාරී අසනීප තත්ත්වයෙන් පසුවීම හේතුවෙන් නව පරීක්ෂණ නිලධාරී 2025.02.28 දින පත්කර ඇති අතර මේ වන විට විධිමත් විනය පරීක්ෂණ සිදු කරමින් පවතී. **ගොණු අංක CF/DPJ/2023/14 - විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනී B.V.R.N. චික්‍රමරත්න මහත්මියට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.** 2023.07.04 දිනැතිව මෙම නිලධාරිනියගේ රාජකාරී වැඩතහනම් කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් 2024.01.05 දිනැතිව චෝදනා පත්‍ර නිකුත් කර ඇත. ඒ සඳහා නිලධාරිනිය 2024.01.24 දිනැතිව පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් 2024.11.28 දිනැතිව පරීක්ෂණ මණ්ඩලය සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, ඒ අනුව 2024.12.11 දිනැතිව පරීක්ෂණ මණ්ඩලය පත් කර ඇත. මේ වන විට විධිමත් විධිමත් විනය පරීක්ෂණය සිදු කරමින් පවතී. **ගොණු අංක CF/DPJ/2023/19 - විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනී ජී.එස්.ජේ.ගමගේ මහත්මියට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.** මෙම නිලධාරිනිය වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් 2024.04.09 දිනැතිව චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර ඒ සඳහා නිලධාරිනිය විසින් 2024.06.29 දිනැතිව පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් 2024.10.08 දිනැතිව පරීක්ෂණ මණ්ඩලය සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, 2024.10.24 දිනැතිව පරීක්ෂණ මණ්ඩලය පත් කර ඇත. මේ වන විට විධිමත් විනය පරීක්ෂණය සිදු කරමින් පවතී.

		ගොණු අංක CF/DPJ/2023/20 - විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනී එම්.එම්. ඩයස් මහත්මියට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් 2024.04.09 දිනැතිව චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර 2024.05.25 දිනැතිව චුදිත නිලධාරිනිය විසින් පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් මෙම නිලධාරිනිය සියලු චෝදනා සඳහා වැරදිකරු බවට තීරණය කර වැටුප් වර්ධක 01ක් විලම්භනය කිරීමට සහ අලාභය සම්බන්ධයෙන් නිලධාරිනිය වගකිව යුතු වන්නේ අදාළ අලාභයේ ප්‍රමාණය එම නිලධාරිනියගෙන් අය කර ගැනීමට විනය නියෝග ලබා දී ඇත. ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්ෂකගේ අංක GHK/EG/11/2024 හා 2025.08.04 දිනැති ලිපිය මඟින් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමට විනය නියෝගය ක්‍රියාත්මක කර ඇති බව දන්වා ඇත. මෙහි විධිමත් විනය පරීක්ෂණය කඩිනමින් අවසන් කරන ලෙසට අදාළ පරීක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඇත. තවද මෙම සිද්ධියට අදාළ සමස්ථ අලාභය අයකර ගැනීමට අදාළ මු.රෙ. 104 ප්‍රකාරව ද කටයුතු සිදු කරනු ඇත.
04	විධිමත් ලෙස විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම	නොවැළැක්විය හැකි හේතූන් මත 2022 වර්ෂය තුල නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීමට නොහැකි වුවද රැස්වීම් 03ක් පවත්වා ඇත. 2023 වර්ෂයේ සිට චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත පරිදි කාර්තුවකට 01 බැගින් කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත. 2024 වර්ෂ සඳහා මේ වන විට 2024.03.21, 2024.07.26, 2024.11.06 හා 2024.12.09 යන දිනයන්හි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති අතර හතරවන කාර්තුවට අදාළ කමිටු රැස්වීම ද 2025.01.31 දින පවත්වන ලදී. එසේම 2025 වර්ෂයේ මුල් කාර්තු 02ට අදාළවද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා අවසන් කර ඇත. පළාත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්ද 2024 වර්ෂය තුළ චක්‍රලේඛනානුකූලව කාර්තුවකට 01 බැගින් පැවැත්වීම සඳහා නිරන්තරයෙන් අදාල කමිටු සභාපතීන් වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව 2024 වර්ෂය සහා වන පළාත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා අවසන් කර ඇති අතර 2025 වර්ෂය සඳහාද මේ වන විට මුල් කාර්තු 02ට අදාලව පළාත් සියල්ලෙහිද 03 වන කාර්තුවට අදාලව පළාත් 03කද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්ද පවත්වා අවසන් කර ඇත. එසේම 2025 වර්ෂයේ 03 වන කාර්තුවට අදාල පළාත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හා 04 වන කාර්තුවට අදාල රැස්වීම් පවත්වා අවසන් කරන ලෙසට පළාත් කමිටු සභාපතීනවරුන් ද දැනුවත් කර ඇත.

05	ඖෂධ ප්‍රසම්පාදනය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටු නිර්දේශයකින් තොරව වෛද්‍ය සැපයීම් මිලදී ගැනීම	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයීම්) ගේ අංක MSD/FIN/MSB/25/2023 හා 2023.07.21 දිනැති ලිපියට අනුව 2024 වර්ෂයේදී ඖෂධ සමාලෝචන කමිටු පවත්වා නිර්දේශිත ඖෂධ ලැයිස්තුව සඳහා (අයිතම 1331) අනුමැතියද සමඟින් අදාළ අංශ වෙත යොමු කරන ලද අතර, වෛද්‍ය සැපයුම් කළමනාකරණ දත්ත පද්ධතිය (MSMIS) යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. 2026 වර්ෂයේ දී 2025 – 2026 ශල්‍ය අයිතම හා එක්ස්රේ අයිතම සඳහා වට්ටෝරු සමාලෝචන කමිටු රැස්කරන ලදී. එහිදී සාමාන්‍ය ශල්‍ය පාරිභෝජ්‍ය අයිතම සහ පාරිභෝජ්‍ය නොවන ශල්‍ය අයිතම කමිටු හැර සෙසු ශල්‍ය වට්ටෝරු සමාලෝචන කමිටු සියල්ල පවත්වා එම කමිටු වල නිර්දේශ අනුමැතිය ද සහිතව අවශ්‍ය කටයුතු සඳහා අදාළ අංශ වෙත යොමු කරන ලදී. මේ වන විට වෛද්‍ය සැපයුම් කළමනාකරණ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතී. ඖෂධ සඳහා ප්‍රමුඛතා ලැයිස්තුව යාවත්කාලීන කිරීම 2025 වර්ෂයේ සිදුකර අයිතම 883 ක ලැයිස්තුවක් ද ශල්‍ය හා එක්ස්රේ අයිතම සඳහා ප්‍රමුඛතා ලැයිස්තුව යාවත්කාලීන කිරීම 2026 වර්ෂයේදී සිදුකර අයිතම 3937 ක ලැයිස්තුවක් ද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සනින් චක්‍රලේඛයක් ලෙස නිකුත් කර ඇත. තවද රසායනාගාර අයිතම (වට්ටෝරු ලේඛණයේ අන්තර්ගත වී ඇති) සියල්ලම ප්‍රමුඛතා අයිතම (Priority Items) ලෙස ඇතුළත් කර ඇත.
06	එකම ඖෂධය වෙළඳනාම විශාල සංඛ්‍යාවක් යටතේ ලියාපදිංචි වී තිබීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම.	රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව යටතේ ඇති බද්ධ ව්‍යාපාර මඟින් මේ වන විට රජයේ රෝහල් වලට අවශ්‍ය වන අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග 148ක ප්‍රමාණයක් නිෂ්පාදනය කරයි. නව ඖෂධ නිෂ්පාදන 12ක් සඳහා ලියාපදිංචියට අයදුම් කර ඇති අතර එයින් පහත නිෂ්පාදන 04ක් සඳහා අනුමැතිය ලැබී ඇත. • Celecoxib Capsules 200mg • Montelukast Tablets IP 5mg • Methy Iprednisolone Tablets USP 4mg • Montelukast Tablets IP 10mg මිල්ලනිය ප්‍රදේශයේ ආයෝජන කලාපයක් ආරම්භ කිරීම සඳහා මූලික සැළසුම් කිරීමේ කටයුතු ආරම්භ කරමින් පවතී. ලෝක බැංකු ආධාර යටතේ යන්ත්‍ර සූත්‍ර වැඩි දියුණු කිරීම සම්පූර්ණ කර ඇති අතර මේ වන විට නිෂ්පාදන කටයුතු සාර්ථකව සිදු කරමින් පවතී.

07	සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ ස්ථාපිත කර තිබූ Medical Supply Management Information System (MSMIS) පද්ධතිය හා ස්වස්ථ පද්ධතිය	MSMIS ස්වස්ථ පද්ධතිය පෙර පැවැති MSMIS Pronto පද්ධතිය භාවිතා නොකළ රෝහල් හා ගබඩා සඳහා ව්‍යාප්ත කිරීමට අයත් විය. ඒ අනුව ස්වස්ථ පද්ධතිය රෝහල් හා සෞඛ්‍ය ආයතන වල ප්‍රධාන ගබඩා සහ අනෙකුත් ගබඩාවන් දක්වා ව්‍යාප්ත කර ඇත. 2025 වර්ෂය සඳහා ස්වස්ථ පද්ධතිය මඟින් මාර්ගගතව (Online) වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ ආයතන හා ගබඩා ගණන 2360 කි. 2024/05/01 දින වන විට අවම වශයෙන් ඇනවුම් 05 ක් ස්වස්ථ පද්ධතිය මඟින් ලබා ගැනීම සිදුකළ ආයතන හා ගබඩා ගණන 1891 ක් වේ. මේ වන විට පද්ධතිය තුළ පද්ධති පරිශීලකයින් 12000 කට අධික ප්‍රමාණයක් ලියාපදිංචි වී එදිනෙදා වැඩ කටයුතු සිදුකරයි. MSMIS ස්වස්ථ මෘදුකාංග පද්ධතිය මේ වන විට රෝගියාගේ ඖෂධ තුන්ඩුව (Prescription) දක්වා පරිභෝජන දත්ත ලබාගත හැකි ආකාරයට නිර්මාණය කර ඇති අතර ඖෂධ තුන්ඩු (Prescription) මිලියන 1.688 පද්ධතිය හරහා නිකුත් කර ඇත. ඒ අනුව MSMIS ස්වස්ථ මෘදුකාංග මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය සතු සියලුම රෝහල්වල රෝගියාගේ බෙහෙත් තුන්ඩුව දක්වා පරිගණක ගත කිරීමට අමාත්‍යාංශයේ මූල්‍යමය ප්‍රමුඛතා සහ ප්‍රතිපත්තිමය තීරණ වලට යටත්ව සිදුකළ හැක.
08	බෙහෙත් හිඟයක් පැවතීම සහ ප්‍රමිතියෙන් තොර බෙහෙත් ගෙන්වීම	<u>බෙහෙත් හිඟයක් පැවතීම වැලැක්වීම සඳහා පහත සඳහන් පියවර ගෙන ඇත</u> **(i.)** විවිධ හේතූන් මත අප විසින් ඇණවුම් කරන වෛද්‍ය සැපයීම් නියමිත කාලයට නොලැබෙන බැවින් (**SPC , SPMC** හා දේශීය නිෂ්පාදකයින්) ඇතැම් ඖෂධයන් වල විටින් විට හිඟතාවයක් ඇතිවන අතර ඒවා අවම කිරීමට සතිපතා අදාල සියලු පාර්ශවයන් කැඳවා සමාලෝචන රැස්වීම් පවත්වා තීරණ ගනු ලබයි. **(ii.)** දේශීය නිෂ්පාදකයින්ගේ ප්‍රමිතිය සහතික කරන ලද නිෂ්පාදන විධිමත් ක්‍රමවේදයක් හරහා මිලදී ගෙන ඖෂධ හිඟයන් අවම කිරීමට කටයුතු කරනු ලැබේ. **(iii.)** සැපයුම්කරුවන් හිඟ හා සැපයුම්කරුවන් නොමැති ඖෂධ සඳහා විකල්ප ක්‍රියාමාර්ග තුලින් ඖෂධ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. උදා : **UNDP / UNISEF** <u>ප්‍රමිතියෙන් තොර බෙහෙත් ගෙන්වීම වැලැක්වීම සඳහා පහත සඳහන් පියවර ගෙන ඇත.</u> **(i.)** වෛද්‍ය සැපයීම් ලබා ගැනීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය හෝ විශේෂඥ මණ්ඩලයක නිර්දේශය මත NMRA විසින් නිකුත් කරන WOR (Waver of Registration) මත ලබා ගැනීම සිදු කෙරේ. එමගින් තත්ත්ව නියාමනයක් පූර්ව වශයෙන් සිදුවන බව සලකයි.

		(ii.) වෛද්‍ය සැපයීම් භාරගැනීමේදී නිෂ්පාදක විසින් නිකුත් කරන තත්ත්ව විශ්ලේෂණ වාර්තා ලබා ගැනීම සිදු කරයි. **(iii.)** රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් පුර්ව සාම්පල පරීක්ෂාවන් නව සැපයුම් සඳහා අනිවාර්ය කර ඇත. මෙහිදී යම් අපගමනයක් සිදු කරන්නේ නම් අදාල පාර්ශවයන් වන ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු වල එකඟතාවය මත තීරණ ගනු ලැබේ. **(iv.)** මෙයට අමතරව අහඹු ලෙස ලබාගත් සාම්පල පරීක්ෂාවක් (සියලුම බහාලුම් සඳහා නොවේ) සඳහා තත්ත්ව පාලන අංශය මඟින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත යොමු කරන අතර එහිදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ රසායනාගාර මඟින් පරීක්ෂා කරනු ලබයි. එහිදී යම් ගැටළුවක් මතුවුවහොත් එය NMQAL (National Medical Quality Assurance Laboratory - ජාතික තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය) වෙත යොමු කර ලැබෙන වාර්තා අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබයි. **(v.)** යම් හෙයකින් ප්‍රමිතිය සම්බන්ධ පැමිණිලි ලැබුනහොත් ඒ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග හා පරීක්ෂණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) මඟින් පවත්වනු ලැබේ.
09	වෛද්‍ය සැපයීම් වල තත්ත්ව පරීක්ෂා කරන රසායනාගාර සඳහා ප්‍රතීතන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ කටයුතු යාවත්කාලීන කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන් දැනට ආරම්භ කර ඇත. • වැඩ බලන අධ්‍යක්ෂකවරයෙකු පත්කර ගැනීම. මීට පෙර සිටි අධ්‍යක්ෂකවරයා විශ්‍රාම ගියපසු එම පුරප්පාඩුව පුරවා නොමැති වූ අතර ඒ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සේවය කළ ආචාර්ය වම්ලා ලියනාරච්චි මහත්මිය වැඩ බලන පදනම මත බඳවා ගන්නා ලදී. එයින් පසු සිදුකරනු පර්යේෂණ සංඛ්‍යාවේ යම්කිසි ප්‍රගතියක් දක්නට ලැබේ. • ඖෂධ විශ්ලේෂකයින් බඳවා ගැනීම. 2025 ජනවාරි 01 වන දින ඖෂධ විශ්ලේෂකයින් 15 දෙනෙකු බඳවා ගන්නා ලද අතර තවත් කණ්ඩායමක් බඳවා ගැනීම සඳහා අයදුම් පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට සැලසුම් කර ඇත. මේ බඳවා ගැනීම් සමඟ ඉතා බරපතල ගැටලුවක්ව තිබූ කාර්යමණ්ඩල හිඟය යම් ප්‍රමාණයකින් විසඳෙනු ඇත. ඒ අනුව සිදුකරන පර්යේෂණ සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිකර ගැනීමට හැකිවනු ඇත. • රසායනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම. රසායනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම දැන් ආරම්භ කර ඇත.

		• රසායනාගර සඳහා ඉඩපහසුකම් වැඩිකර ගැනීම. 2024 මැද භාගය වන තුරු ඖෂධ විශ්ලේෂක අංශය සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනෙකුත් අංශ පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල ඖෂධ පර්යේෂණාගාරය සඳහා ලබාදීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කරන ලදී. ඒ අනුව රසායනාගාරය සඳහා ඉඩ පහසුකම් වැඩිකර ගැනීමත් සමඟ එහි කටයුතු වැඩිදියුණු කරගත හැකි වනු ඇත. • ශ්‍රී ලංකාව තුළ ඇති අනෙකුත් රසායනාගාර සමඟ සම්බන්ධීකරණයන් ගොඩනගාගෙන ඒවා වෙත ඖෂධ සාම්පල් යැවීමට කටයුතු කර ඇත. ඒ අනුව MRI, ITI, SLINTEC, කොළඹ වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය යන ආයතන වලට ඖෂධ සාම්පල් යැවීමට කටයුතු සකස් කෙරෙමින් පවති. • නව කාර්යමණ්ඩල බඳවාගෙන ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ පසු ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙතින් අනුකූලතා තක්සේරු සහතික ලබා ගැනීමට කටයුතු කරනු ඇත.
10	වෛද්‍යවරු විදේශගත වීම	2024.10.30 දිනැති පශ්චාත් සිමාවාසික වෛද්‍ය නිලධාරී කණ්ඩායමට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී පත්වීම් ලබාදීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර (වෛද්‍යවරුන් 1408) ඉදිරි සතිය ඇතුළත එම වෛද්‍යවරුන් ඔවුන්ගේ නව සේවා ස්ථානයන් වෙත රාජකාරි සඳහා වාර්තා කිරීමට අපේක්ෂිතය. ඒ අනුව වෛද්‍ය නිලධාරීන් විදේශ ගතවීම මත ඇති වී තිබෙන පුරප්පාඩු ප්‍රමාණයක්ද මෙමඟින් සම්පූර්ණ වනු ඇත.
11	විගණකාධිපති වාර්තාවේ සංෂිප්ත සටහනේ (2023.06.23) අඩංගු විගණන කරුණු සම්බන්ධව පිළිතුරු සැපයීම	මගේ අංක CA/AQ/FCC 02/COPA/2019-2021/MOH/2023(III) හා 2023.09.07 හා 2023.09.15 දිනැතිව පිළිතුරු ඉදිරිපත් කර ඇත.

වෛද්‍ය නලින්ද ජයතිස්ස
ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය

වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, "සුවසිරිපාය",
පූජ්‍ය බුද්ධෝගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.